පුවත් වාර්තාවක් හෝ ලිපියක් තුළ අන්තර්ගත සිදුවීමට සෘජුව අදාළ නොවන අවස්ථාවක වුවද "රූමත්" වැනි විශේෂණ ඔස්සේ පුද්ගලයෙකුගේ බාහිර ස්වරූපය ඉස්මතු කොට දැක්වීමත්, භාවාතිෂය ආකාරයකින් එවැනි සිදුවීම් ඉදිරිපත් කිරීමත් කෙතරම් මාධ්‍ය ආචාර ධර්මයන්ට යෝග්‍ය වන්නේදැයි පාඨක අප විමසිය යුතු වේ.

"රස පහස දෙන මුවාවෙන් යහනට කැඳවා මත්කොට කෝටි ගණනක් සුද්ද කර හැංගුණු රූමතිය කවුද?" යන සිරස්තලය ඔස්සේ ඉරිදා මව්බිම (මැයි 15, 2022) පුවත්පතේ පළවී තිබූ ලිපිය ඊට නිදසුනකි.

1) මෙහි කාන්තාවකගේ බාහිර රූපය ඉස්මතු කොට ඉදිරිපත් කෙරෙන "රූමත්" යන යෙදුම ඔස්සේ, කාන්තාව ස්ත්‍රී පුරුෂ භාවය පදනම් කරගනිමින් කොන් කිරීමක් සිදුවේ යැයි ඔබ නොසිතන්නේ ද?

2) එසේම, මෙවැනි භාවාතිෂය යැයි කිව හැකි වාර්තාකරණයන් ඔස්සේ, එම සිදුවීම තුළින් විග්‍රහ විය යුතු සමාජ ගැටළුව පාඨකයාට හසුවී නොයනු ඇතැයි ඔබ නොසිතන්නේ ද?

ඔබේ අදහස?